කාය ව්‍යවච්ඡේද අධ්‍යයනාංශය, වෛද්‍ය පීඨය
ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය, කුලියාපිටිය
உடற்கூறியல் பிரிவு, மருத்துவ பீடம்
இலங்கை வயம்ப பல்கலைக்கழகம், குளியாபிடிய
DEPARTMENT OF ANATOMY, FACULTY OF MEDICINE
WAYAMBA UNIVERSITY OF SRI LANKA, KULIYAPITIYA

දුරකථන / தொலைபேசி / Telephone (+94)373139795
ෆැක්ස් / பெக்ஸ் / Fax (+94)372284663
විද්‍යුත් තැපැල / மின் அஞ்சல் / E-mail anatomy@wyb.ac.lk

ගරු ස්වාමීන්වහන්ස / පූජකතුමනි,
මහත්මයාණෙනි/ මහත්මියනි / මෙනවියනි,

<u>වෛද්‍ය අධ්‍යාපනය හා වෛද්‍ය පර්යේෂණ සඳහා මෘත දේහ පරිත්‍යාග කිරීමේදී අනුගමනය කල යුතු ක්‍රියා පිළිවෙත්</u>

මරණින් පසුව ඔබගේ දේහය වෛද්‍ය පීඨයට ප්‍රදානය කිරීම සඳහා ඔබ තුළ ඇති කැමැත්ත ඉතා අගය කොට සලකමු. මරණින් පසු මෘත දේහයේ භාරකාරත්වය ඥාතීන් / භාරකරුවන් සතුවේ. එම නිසා ඔබ ඒ සඳහා ඥාතීන් පහත සඳහන් උපදෙස් පරිදි දැනුවත් කර තිබීම වැදගත් වේ.

01. මෘත දේහයක් පරිත්‍යාග කළ හැක්කේ <u>ස්වාභාවික මරණයක් නම් පමණක්</u> වන අතර පහත සඳහන් ආකාරයේ මෘත දේහ පරිත්‍යාග කල නොහැක.

- අවුරුදු 21ට අඩු නම්.
- මිය යන විට පිළිකා, මෙනින්ජි ප්‍රදාහය (Meningitis), ක්ෂය රෝගය, සෙංගමාලය, එච් .අයි.වී /ඒඩ්ස්, දද, කුෂ්ඨ වැනි රෝග වැළඳී තිබීම.
- පශ්චාත් මරණ පරීක්ෂණයක් සිදු කළ මෘත දේහ.
- ඇස් හැර අනෙකුත් අවයව ඉවත් කල හෝ පරිත්‍යාග කල මෘත දේහ.
- මරණින් පසු අවශ්‍ය පරිදි එම්බාම්(ස්වාරක්ෂණය) කිරීමකින් තොරව පැය 18 ක් කල් ඉකුත් වූ මෘත දේහ.
- ප්‍රධාන ශල්‍යකර්මවලට භාජනය කල මෘත දේහ

02.

2.1 දෙපාර්තමේන්තුවට භාරදීමට ප්‍රථම මෘත දේහය අනිවාර්යයෙන්ම එම්බාම් කළ යුතු වේ. එම්බාම් කළ යුත්තේ පාදයේ කලවා පෙදෙසේ ඉහල කොටසේ ඉදිරියෙන් පිහිටි ඌර්ව ධමනිය තුළින් ස්වාරක්ෂක තරලය (40% ෆෝමලින්) ලීටර් 5 ක් ශරීරයට ඇතුළු කිරීමෙනි.

2.2 ඉහත කී ආකාරයට හැර අන් කිසිදු ආකාරයකින් එම්බාම් කර භාරදෙන මෘත දේහ භාරගනු නොලැබේ.

2.3 අක්ෂිදාන සංගමයට මියගිය තැනැත්තාගේ ඇස් දන් දීම ගැන විරුද්ධත්වයක් නොමැත. (ශරීරයේ වෙනත් කොටසක් කැපීම හෝ ඉවත් කිරීම නොකළ යුතුය.)

03.

3.1 මරණය සිදු වූ වහාම ඒ බව ඥාතීන් / භාරකරුවන් විසින් පහත සඳහන් නිලධාරීන්ගෙන් එක් අයකු දැනුවත් කල යුතුය.

- ආචාර්ය කේ.එම්. චන්දිමාල් (අංශ ප්‍රධාන) — 0711141591
- බී.එම්.ඩී.ටී. බණ්ඩාර (සහකාර ලේඛකාධිකාරී) — 0719015190
- එම්.එම්.එම්. මුනාසියර් (තාක්ෂණික නිලධාරී) — 0762039204/ 0719191180
- කාය ව්‍යවච්ඡේද දෙපාර්තමේන්තුව (සතියේ දිනයන්හිදී කාර්යාල වේලාව තුලදී පමණි) — 0373139795

3.2 පෙ.ව. 8.00ත් ප.ව. 5.00ත් අතර දේහය දෙපාර්තමේන්තුවට භාරදිය යුතු අතර දේහය භාරදීමට පෙර ඉහත දක්වා ඇති දුරකථන අංකවලට හෝ දෙපාර්තමේන්තුව වෙත පැමිණ දැනුම්දිය යුතුය.

3.3 ඉඩකඩ ප්‍රමාණවත් නොවන අවස්ථාවන්හිදී මෘත දේහ භාර නොගන්නා බව කරුණාවෙන් සලකන්න.

3.4 මෘත දේහය වෛද්‍ය පීඨයට භාර දීමේදී අනිවාර්යයෙන් සැපයිය යුතු ලිපි ලේඛන,

- මරණය ලියාපදිංචි කිරීමේ සහතිකයේ මුල් පිටපත හා සහතික කල ඡායා පිටපතක්
- දායකයාගේ ජාතික හැඳුනුම්පතෙහි මුල්පිටපත හා සහතික කල ඡායා පිටපතක්
- ඥාතියාගේ / භාරකරුගේ ජාතික හැඳුනුම්පතෙහි මුල්පිටපත හා සහතික කල ඡායා පිටපතක්
- මෘත ශරීර භාරදීමේ පොරොන්දු පත්‍රයේ පිටපත
-

(සැ.යු. : සියලුම මුල් පිටපත් නැවත බාර දෙනු ලැබේ. )

3.5 මෘත දේහයක් පරිත්‍යාග කිරීමට පැමිණෙන පුද්ගලයන් විසින් සැලකිලිමත් විය යුතු අනෙකුත් කරුණු,

- වෛද්‍ය පීඨයට ප්‍රදානය කල මෘත දේහයක් යලිත් දැක ගැනීමට කිසිවෙකුට අවසර නොලැබේ.
- වෛද්‍ය පීඨය විසින් ප්‍රවාහන පහසුකම් හෝ වියදම් සපයනු නොලැබේ.
- වෛද්‍ය පීඨය තුල ආගමික හෝ වෙනයම් උත්සවයක් පැවැත්වීමට අවසර නොලැබේ.
- ඥාතින්ගේ / භාරකරුගේ ඉල්ලීම පරිදි වෛද්‍ය පීඨය තුලදී දායකයාගේ දේහයෙන් සාදනු ලබන ඇටසැකිල්ල හෝ ඇටසැකිල්ලේ කොටස් පිලියෙල කර දෙනු නොලැබේ.

04. මෘත දේහ, අධ්‍යනාංශය වෙත භාරගැනීමේ අවසාන තීරණය කායව්‍යවච්ඡේද දෙපාර්තමේන්තුවේ අංශ ප්‍රධානියා සතුවේ.

..................................................

අංශ ප්‍රධානි
කායව්‍යවච්ඡේද දෙපාර්තමේන්තුව
වෛද්‍ය පීඨය
වයඹ විශ්ව විද්‍යාලය

කාය ව්‍යවච්ඡේද අධ්‍යයනාංශය, වෛද්‍ය පීඨය
ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය, කුලියාපිටිය

உடற்கூறியல் பிரிவு, மருத்துவ பீடம்
இலங்கை வயம்ப பல்கலைக்கழகம், குளியாபிடிய

DEPARTMENT OF ANATOMY, FACULTY OF MEDICINE
WAYAMBA UNIVERSITY OF SRI LANKA, KULIYAPITIYA

දුරකථන / தொலை பேசி / Telephone } (+94)373139795
ෆැක්ස් / பெக்ஸ் / Fax } (+94)372284663
විද්‍යුත් තැපැල / மின் அஞ்சல் / E-mail } anatomy@wyb.ac.lk

ලියාපදිංචි අංකය WU/FOM/BD/..............................

# <u>මෘතදේහ පරිත්‍යාග කිරීම සඳහා අයදුම්පත</u>

**01.** දායකයාගේ විස්තර

1.1 සම්පූර්ණ නම: ..............................................................................................

..............................................................................................

1.2 ලිපිනය :..............................................................................................

..............................................................................................

1.3 ජා.හැ. අංකය :..............................................................................................

1.4 වයස :..............................................................................................

1.5 දුරකථන අංක : 1........................................ 2........................................

1.6 ස්ත්‍රී පුරුෂ භාවය : ස්ත්‍රී / පුරුෂ

1.7 ශල්‍යකර්මයකට භාජනය වී ඇත්නම් ඒ පිළිබඳ විස්තර : ........................................

..............................................................................................

1.8 පහත දැක්වෙන කුමන හෝ රෝගයකින් ඔබ පසුවන්නේද?

පිළිකා ☐ මෙනින්ජයි ප්‍රදාහය ☐ ක්ෂය රෝගය ☐ සෙංගමාලය ☐

එච්. අයි. වී / ඒඩ්ස් ☐ දද / කුෂ්ට ☐

වෙනත්..............................................................................................

**02.** දායකයාගේ ආසන්න ඥාතියා / භාරකරුගේ විස්තර

2.1 සම්පූර්ණ නම :..............................................................................................

..............................................................................................

2.2 ලිපිනය :..............................................................................................

2.3 ජා.හැ. අංකය :..............................................................................................

2.4 දායකයාට ඇති ඥාති සම්බන්ධතාවය : ..............................................................

2.5 දුරකථන අංක : 1........................................ 2........................................

මා මිය යාමෙන් පසුව මාගේ මෘත දේහය වෛද්‍ය අධ්‍යාපනය සහ වෛද්‍ය පර්යේෂණ සඳහා වයඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ කායව්‍යවච්ඡේද අධ්‍යනාංශයට පරිත්‍යාග කිරීමට කැමැත්ත මෙයින් ප්‍රකාශ කර සිටිමි.

මේ සම්බන්ධයෙන් වයඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ උපදෙස් පත්‍රිකාවේ දක්වා ඇති උපදෙස් අනුව කටයුතු කරන බවද මෙයින් ප්‍රකාශ කරමි.

මෙයට විශ්වාසී,

.......................................... ..........................................
දායකයාගේ අත්සන දිනය

සැලකිය යුතුයි :

- අයදුම්පතෙහි පිටපතක් ඔබගේ ඥාතියෙකු/භාරකාරයෙකු භාරයෙහි තැබිය යුතු අතර, මෘත දේහය පරිත්‍යාග කිරිමේදී අදාළ අයදුම්පතෙහි පිටපත සමග දේහය දෙපාර්තමේන්තුව වෙත භාර දියයුතුය.
- මෘත දේහ පරිත්‍යාග කිරිම සඳහා දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී සිටියද වෛද්‍ය පීඨයෙන් නිකුත් කළ උපදෙස් පත්‍රිකාවේ කරුණු සම්පූර්ණ වේ නම් පමණක් දේහය භාරගන්නා බව දන්වා සිටිමි.
- අක්ෂි දන් දෙන්නේ නම්, මෘත දේහය කායව්‍යවච්ඡේද දෙපාර්තමේන්තුවට භාර දීමට පෙර අක්ෂිදාන සංගමයට මියගිය තැනැත්තාගේ ඇස් දන් දීම සිදුකල යුතුය.
- මෘත දේහය පරිත්‍යාග කිරිම සඳහා දෙපාර්තමේන්තුවේ ලියාපදිංචිය අත්‍යාවශ්‍ය නොවේ.

..............................................

අංශ ප්‍රධානි
කායව්‍යවච්ඡේද දෙපාර්තමේන්තුව
වෛද්‍ය පීඨය
වයඹ විශ්ව විද්‍යාලය